00077

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2018

**ESD2235/EPD4535 -** පෞරුෂ මනෝ විද්‍යාව

කාලය - පැය තුන (03) යි.

---

දිනය · 2019 මාර්තු 16 වන දින　　　　වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලු ප්‍රශ්නවලටත් 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටත් (03) පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. "පෞරුෂ මනෝ විද්‍යාව" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

02. "පෞරුෂ ගති ලක්ෂණ" යනු මොනවාදැයි සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

03. සිසුන්ගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි දෙමව්පිය බලපෑම කෙටියෙන් සාකච්ඡා කරන්න.

04. (i) "ඕල්පෝට්" (1996) විසින් පෙන්වා දෙන ලද "මූලික ගති ලක්ෂණ" කාණ්ඩ තුන (03) නම් කරන්න.

(ii) ඔබ ඉහත දක්වන ලද එක් (01) කාණ්ඩයක් පැහැදිලි කරන්න.

05. ළමයින්ගේ පෞරුෂ සංවර්ධනයට ආරමය සාධක බලපාන ආකාරය පැහැදිලි කරන්න.

06. ප්‍රජානන පර්යාලෝකයට අනුව "පෞරුෂ අක්‍රමතා" විස්තර කරන්න.

07. අන්තර්වර්තික පෞරුෂ ගති ලක්ෂණ පහක් (05) නම් කරන්න.

08. ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදයෙන් ඉස්මතු කෙරෙන පෞරුෂ වර්ධනයේ අවධි පහ (05) නම් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) පෞරුෂය පිළිබඳ චර්යාවාදී පර්යාලෝකය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පෞරුෂය පිළිබඳ චර්යාවාදී පර්යාලෝකය මනෝ විශ්ලේෂණවාදී පර්යාලෝකයෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) (a) කාංසාමය අක්‍රමතාවය යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(b) කාංසාමය අක්‍රමතාව ප්‍රාථමික පාසල් ළමුන් තුළ සංවර්ධනය වීමට හේතු දක්වන්න. (ලකුණු 05)

(ii) (a) කාංසාමය අක්‍රමතාවයෙන් පෙළෙන ළමයින් තුළ දක්නට ලැබෙන ගති ලක්ෂණ හෝ චර්යා පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 05)

(b) මෙම අක්‍රමතාවයෙන් මිදීමට, ගුරුවරයාට මෙම ළමයින්ට උපකාර විය හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

11. (i) පුද්ගල විවිධතා යනුවෙන් හඳුන්වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) පුද්ගල විවිධතා ඇතිවීම කෙරෙහි බලපාන සාධක නම් කරන්න. (ලකුණු 05)

(iii) ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස ඔබ සිසුන්ගේ පුද්ගල විවිධතා සැලකිල්ලට ගෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) කුඩා ළමයින්ගේ චර්යාව තක්සේරු කිරීම සඳහා නිරීක්ෂණය යොදා ගත හැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලියට" අනුව පුද්ගලයෙකුගේ පෞරුෂය සංවර්ධනය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) ගුරුවරයෙකුට මුල් ළමාවියෙහි පසුවන ළමයින්ගේ පෞරුෂ සංවර්ධනය පිළිබඳ මනා දැනුමක් ලබා ගැනීමේ ඇති වැදගත්කම උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) මුල් ළමාවියෙහි පසුවන ළමයින්ගේ පෞරුෂ සංවර්ධනයෙහි ලා ගුරුවරියකගේ භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 10)



හිමිකම් ඇවිරිණි.